# උපකුලපති තනතුර සඳහා අයදුම්පත් කැඳවීමයි

# රුහුණ විශ්වවිද්‍යාලය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 34(1) වගන්තිය ප්‍රකාරව සහ පසු සංශෝධන සහ අංක 03/2023 දරන 2023.04.10 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛයේ විධිවිධාන අනුව **2025 මාර්තු 9 වැනි දින** සිට වසර තුනක් සඳහා රුහුණ විශ්වවිද්‍යාලයීය උපකුලපති තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන යටතේ, උපකුලපතිවරයා පූර්ණ කාලීන නිලධාරියෙකු වන අතර, ඔහු විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන අධ්‍යයන නිලධාරී සහ ගිණුම් නිලධාරී ද වේ. ඔහු/ඇය විශ්වවිද්‍යාල පාලක සභාවේ සහ සනාතන සභාව යන දෙකෙහිම නිල සාමාජිකයෙකු සහ සභාපතිවරයා වන්නේය.

උපකුලපතිවරයා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත ප්‍රකාරව ඔහු/ඇය කලින් ධූරයෙන් ඉවත් වුවහොත්/ තනතුරෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස වසර තුනක කාලයක් හෝ ඔහු/ඇය ඔහුගේ/ ඇයගේ හැටපස්වන වසර සම්පූර්ණ කරන තෙක් යන දෙකින් කලින් සිදු වූ අවස්ථාව දක්වා ධූරය දරයි.

අධ්‍යයන කටයුතු මෙහෙයවීම, ආයතනික කළමනාකරණ ප්‍රතිපත්ති මෙහෙයවීම සහ හඳුන්වාදීම, පාලක සභාවේ ප්‍රතිපත්ති සහ තීරණ ක්‍රියාත්මක කිරීම සහ විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය පරිපාලනය මෙහෙයවීම උපකුලපතිවරයාගේ මූලික වගකීම වේ. ඔහු/ඇය අධ්‍යයන විශිෂ්ටත්වය, විනිවිදභාවය, වගවීම, සහභාගීත්ව කළමනාකරණය, ඵලදායී සහ අපක්ෂපාතී නායකත්වය යන මූලධර්ම ආරක්ෂා කිරීම අපේක්ෂා කෙරේ.

සාර්ථක අයදුම්කරු ශක්තිමත් පර්යේෂණ පැතිකඩක් ඇතුළුව ආයතනික ඉදිරි ඉලක්ක හා ඒවා සපුරා ගැනීම පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු අතර, නායකත්ව ගුණාංග සහිත උපාය මාර්ගික දැක්මක් තිබිය යුතුය. අභ්‍යන්තර හා බාහිර ඇතුලු පාර්ශව සමග මනා අන්තර් ක්‍රියාකාරීත්වයෙන් කටයුතු කිරීමට ඔහුට/ඇයට ශක්තිමත් අන්තර් පුද්ගල කුසලතා, ප්‍රතිපත්ති රාමු පිළිබඳ පැහැදිලි අවබෝධයක් සහ තීරණ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට කැපවීමක් තිබිය යුතුය. තවද, විශ්වවිද්‍යාල ප්‍රජාවට සහ සමාජයට ආයතනික සහ පුළුල් අර්ථයෙන් කැපවීම පෙන්නුම් කරමින් විශ්වවිද්‍යාලයේ ආචාර ධර්ම සහ මෙහෙවර පිළිබඳව ගැඹුරු අවබෝධයක් සහිතව කටයුතු කළ යුතුය. (වැඩිදුර තොරතුරු සඳහා අපේක්ෂිත අයදුම්කරුවන්ට විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිසීමට ආරාධනා කෙරේ: **https://ruh.ac.lk**)

උපකුලපති තනතුර, විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය වැටුප් පරිමාණයේ අධ්‍යයන වැටුපට හිමිකම් ලබන අතර, මූලික වැටුපෙන් 15%ක සංග්‍රහ දීමනාවක්, සත්තිවේදන දීමනාවක්, ඉන්ධන දීමනාවක් ලබා ගැනීමට උපකුලපතිවරයා හිමිකම් ලබයි. ඊට අමතරව උපකුලපති නිල නිවස සහ පහසුකම්ද රියදුරු සමග නිල වාහනයක් ද හිමි වේ.

අයදුම්කරු විසින් විධිමත් අයදුම්පත් සමග පහත ලේඛන සපයා තිබිය යුතුය:

I) අයදුම්කරුගේ උපන් දිනය ඇතුළුව සම්පූර්ණ ජීව දත්ත වාර්තාව (අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු අතර, අයදුම්පත් කැඳවීමේ දිනට වයස අවුරුදු 63 ට අඩු විය යුතුය).

II) විශ්වවිද්‍යාල සංවර්ධනය පිළිබඳ ඉදිරි දැක්ම ප්‍රකාශයක් සහ උපකුලපති තනතුරට පත් වුවහොත් අයදුම්කරු විසින් සාක්ෂාත් කිරීමට අපේක්ෂිත අරමුණු පිළිබඳ විස්තරයක්.

III) රාජ්‍ය සේවයේ, සංස්ථාවල, ව්‍යවස්ථාපිත ආයතනවල හෝ වෙනත් උසස් අධ්‍යාපන ආයතනවල සේවය කරන අයදුම්කරුවෙකු/ බාහිර අයදුම්කරුවන් සම්බන්ධයෙන් ඔහු/ඇය මෙම තනතුරට පත් කරනු ලැබුවහොත් අයදුම්කරු නිදහස් කළ හැකිද යන්න සඳහන් කරමින් තම සේවා යෝජකයාගේ ලිපියක්.

ස්වකීය අයදුම්පත හා ආධාරක ලේඛන, ලේඛකාධිකාරී/පාලක සභාවේ ලේකම්, රුහුණ විශ්වවිද්‍යාලය, වැල්ලමඩම, මාතර, ශ්‍රී ලංකාව යන ලිපිනයට **2024.09.27 දින ප.ව. 3.30 ට පෙර** ලැබෙන සේ ලියාපදිංචි තැපැල යටතේ එවිය යුතුය. නැතහොත් කාර්යාලයීය වැඩ කරන දිනයක, නියමිත දිනට හා වේලාවට පෙර අතින් ගෙනවිත් භාර දීමට හෝ පුළුවන. අයදුම්පත අඩංගු ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ "උපකුලපති තනතුර" ලෙස සටහන් කළ යුතුය.

තවද, ඉහත සඳහන් අයදුම්පත හා ලේඛනවල මෘදු පිටපතක් PDF ආකෘතියෙන් regoffice@admin.ruh.ac.lk විද්‍යුත් තැපැල් ලිපිනයට ඉහත දිනට හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනයෙන් පසු මාස දෙකක් ඇතුළත කාර්යාලයීය වැඩකරන දිනයක විශේෂ පාලක සභා රැස්වීමක් කැඳවනු ලබන අතර, ඇගයීම සහ සම්මුඛ පරීක්ෂණය සඳහා එකී විශේෂ පාලක සභා රැස්වීමට පෞද්ගලිකව පෙනී සිටින ලෙස අයදුම්කරුවන් වෙත දන්වනු ලැබේ. සියලුම අයදුම්කරුවන්ට අවම වශයෙන් විනාඩි දහයක (10) කාලසීමාවක සහ විනාඩි පහළොවක් (15) නොඉක්මවිය යුතු කෙටි ඉදිරිපත් කිරීමක් පාලක සභාව හමුවේ සිදු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. සුවිශේෂී තත්වයක් තුළ, කිසියම් අයදුම්කරුවෙකුට එකී විශේෂ පාලක සභා රැස්වීම ඉදිරියේ එදින පෙනී සිටීමට හැකියාවක් නොමැති නම්, ඔහු/ඇය ඒ පිළිබඳව පාලක සභාවේ ලේකම් වෙත පූර්ව දැනුම්දීමක් සිදුකර ඇත්නම් විද්‍යුත් තාක්ෂණය ඔස්සේ ඒ සඳහා පෙනී සිටීමට අවස්ථාව සලසා දෙනු ලැබේ.

03/2023 කොමිෂන් සභා චක්‍රලේඛයේ දක්වා ඇති විධිවිධාන අනුව, මෙම තනතුර සඳහා තෝරා ගැනීම් පිළිබඳ නිර්දේශ පාලක සභාව විසින් සිදු කරනු ලැබේ. උපකුලපති තනතුරට අදාළ පත් කිරීමේ ක්‍රියා පටිපාටිය පිළිබඳ වැඩි විස්තර සඳහා කරුණාකර ඉහත කොමිෂන් සභා චක්‍රලේඛය බලන්න.

https://www.ugc.ac.lk/attachments/2442Commission%20Circular%20No.%2003-2023.pdf

අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනය සහ වේලාවෙන් පසුව ලැබෙන අයදුම්පත් සලකා බලනු **නොලැබේ.**

**පී.එස්. කළුගම,**
**ලේඛකාධිකාරී සහ පාලක සභාවේ ලේකම්,**
**රුහුණ විශ්වවිද්‍යාලය,**
**වැල්ලමඩම, මාතර.**
**2024.09.01**